# - දැනුම කෙතෙක් දුරට මානසික සහනය ලබා දීමට ඉවහල් වේ ද යන්න පිළිබඳ දාර්ශනික විශ්ලේෂණයක් -

# A Philosophical Analysis of The Extent to which Knowledge Contributes to Mental Peace

## ස්තූතිය

පර්යේෂණ නිබන්ධනයේ උපදේශකයන් ලෙසට කටයුතු කළ කැලණි විශ්වවිද්‍යාලයේ දර්ශන දෙපාර්තමේන්තුවේ අධිපති මහාචාර්ය එච්.පී.එම්.වීරසිංහ මහතාටත්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දර්ශන දෙපාර්තමේන්තුවේ අධිපති මහාචාර්ය පී.ඩී.පී.කලංසූරිය මහතාටත් මගේ ස්තූතිය පුද කරමි.

071
071

මෙම පර්යේෂණ නිබන්ධනය කැලණි විශ්වවිද්‍යාලයේ දර්ශනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා ඉදිරිපත් කරන ලද්දකි.

1984.08.01 ඒ.ඥානරත්න

මෙම නිබන්ධනය ගැන,

උක්ත පර්යේෂණ නිබන්ධන මාතෘකාව සමකාලීනයේ වැදගත්කමකින් යුක්ත බව පළමුව කිව යුතු ය. එහි සමකාලීන වැදගත්කම රඳා පවත්නේ එක් පසෙකින් දැනුමත් අනික් පසින් මානසික සහනයත් අතර පවත්නා සබඳතාව විශ්ලේෂණය කිරීම අතිශයින් ම ප්‍රයෝජනවත් විය හැකි නිසා ය. එසේ ප්‍රයෝජනවත් වන්නේ මෙතෙක් දැනුම විග්‍රහ කිරීමට යොදා ගත් විෂයය ක්ෂෙත්‍රයත් මානසික සහනය විශ්ලේෂණය කිරීමට යොදා ගත් විෂයය ක්ෂෙත්‍රයත් එකිනෙකට සම්බන්ධයක් නොදක්වමින් කිසි දිනක හමු නොවන සමාන්තර රේඛා දෙකක ස්වරූපය ගෙන තිබෙන නිසා ය. නමුත් අවශ්‍ය විය යුත්තේ දැනුමත්, මානසික සහනයත් අතර සම්බන්ධතාව දුරස්තර කිරීම නොව, සමීප කිරීම ය. ආසන්න කිරීම ය. ඒ නිසා දැනුම, සහනය විශ්ලේෂණයට අදාළ වන සෑම විෂයයක ම මාර්ගෝපදේශකත්වය ලබා ගනිමින් ය, මෙවැනි කාලෝචිත පර්යේෂණයක කාර්යය මැනවින් ඉටු කර ගත හැකි වන්නේ.

දැනුමත් මානසික සහනයත් අතර පැවැතිය යුතු මෙම අවශ්‍ය සබඳතාව විශ්ලේෂණය කිරීම අතිවිශේෂ කර්තව්‍යයක් ලෙසට මෙම පර්යේෂණ නිබන්ධනය සලකනු ඇත. දැනුමත් මානසික සහනයත් සම්බන්ධ කිරීම තුළින් ලැබිය හැකි විපුල ප්‍රයෝජන ඉමහත් ය. ඉහත සඳහන් කළ සුවිශේෂීය අධ්‍යයන දෙකෙහි නො-සබඳතාව' නිසා දැනුම, එය තුළින් ද, සහනය එය තුළින් ද පරාරෝපණය වී ඇත. ඒ නිසා දැනුම හා මානසික සහනයේ සිදු වී ඇති පරාරෝපණය ඛණ්ඩනය කිරීම ද මෙහි දී අවධාරණය කෙරේ. නොයෙකුත් සංකල්පීය විග්‍රහයන් නිසා දැනුම හා මානසික සහනය යථාර්ථයෙන් පිටතට ගෙන යාම හෙවත් වියුක්ති කරණය නිසා සිදු වන දුර්විපාකයන්ගෙන් හැකි පමණ මුදා ගැනීමට, විශේෂයෙන් සංකල්පීය චින්තනය නිසා මනෝ විද්‍යාත්මක ඝටකයන්ගේ ආවරණය වීම, අනාවරණය කිරීමත් මෙම අන්තර් විනයමය පර්යේෂණ නිබන්ධනයෙන් උත්සාහ ගනිමි.

මෙම කාර්යය වඩාත් කාලෝචිත යැයි සිතනුයේ දැනුමට, දැනුම් විග්‍රහයට විශ්වාසය පිළිබඳ විග්‍රහයන්, අවිශ්වාසය පිළිබඳ විග්‍රහයන්, මානව විද්‍යාත්මක වශයෙන් වැදගත් යැයි ලෝකයට දැන් දැන් පෙනී ගොස් ඇති නිසා ය. විද්‍යාත්මක චින්තනයෙන් ලද ජයග්‍රහණය ගැන පමණක් අවධානය යොමු කිරීමෙන් උද්ගත වී ඇති මානවීය ගැටලු, මානවීය අසහනය තුරන් කිරීම කාලීන වශයෙන් එලදායි වී ඇත. මෑතක සිට විද්‍යාත්මක වශයෙන් දියුණු බොහෝ රටවල දැනුමේ දෙවැනි පරිමාණයක අවශ්‍යතාව ගැන අවධානය යොමු කිරීම අරඹා ඇත්තේ ඒ නිසා විය හැකි ය. දැනුම හා සහනය තේමා කොට ගෙන ඉදිරිපත් කරන මෙම නිබන්ධනය මානව අවශ්‍යතාවන් සපුරාලීමක්,සමාජ අදාළත්වය දැක්මක් ලෙසට සැලකිය හැකි ය. මෙයින් ද සනාථ වන්නේ දැනුම හුදෙක් ස්වතන්ත්‍ර ව විග්‍රහ කිරීමට වඩා එහි මානසික පරිමාණය මානව පැත්තෙන් බලා විග්‍රහ කිරීම ඉතා උචිත බවයි.

නිවැරදි දැනුම හෙවත් සහනය ලබා ගැනීමේ දී බහුවිද විනයයන්ගේ ආභාසය ලැබිය යුතු ය යන නිබන්ධනයේ මූලික අරමුණ ඉටු කිරීමේ දී මුහුණ දීමට සිදු වූ ප්‍රධාන බාධකය වන්නේ මෙවැනි පරමාර්ථයකින් රචිත පොත්පත්වල හිඟකම යි. මා දන්නා තරමින් මේ සම්බන්ධයෙන් ප්‍රකාශිත කෘතියක් නොමැති තරම් ය. දැනුම, මානසික සහනය පිළිබඳ විවිධ පොත-පත ලියැවී තිබුණ ද ඒවා බොහෝ දුරට තමන්ගේ විෂයක්ෂේත්‍රය හෝ තමන් පිළිගත්තා වූ මත හෝ අදහස් හෝ සනාථ කිරීමට වන අතර එසේත් නැත්නම් භෞතික හෝ විඥානවාදී පදනමක් මත රචිත ඒවා විය.

මේ නිසා විවිධ කෘති ඇසුරු කිරීමේ දී ඒවායේ ඇතුළත් කාරණා තෝරා බේරා ගැනීම තරමක අපහසුවකි.

බටහිර දර්ශනය කෙරෙහි විශේෂ අවධානයක් නිබන්ධන කරණයේ දී දක්වා ඇති බව කිව යුතු ය. බටහිර් දර්ශනයේ පෙනෙන විශේෂ ලක්ෂණයකි වන්නේ එක්

පැත්තකින් විඥාන වාදයත්, අනිත් පැත්තෙන් භෞතික වාදයත් අතර සටනක ස්වරූපය යි. මෙවැනි ස්වරූපයක් දරන බටහිර දර්ශනයට, පක්ෂග්‍රාහී බවින් තොර ව අවතීර්ණ වීම ද අපහසු කාර්යයකි. එමෙන් ම දැනුම නමැති ඉතාම පුළුල් ක්ෂෙත්‍රයක් සංක්ෂිප්ත කර මෙවැනි නිබන්ධනයක් මගින් ඉදිරිපත් කිරීම ද ඉතා දුෂ්කර ය.

කෙසේ වුව ද විවිධ දුෂ්කරතා මධ්‍යයේ මෙතෙක් ස්වතන්ත්‍ර ව පැවැතියා වූ විෂයක්ෂෙත්‍ර කීපයක් සමීප කිරීමට, එක්තැන් කිරීමට හැකි වුවා යැයි සිතමි. එම කාර්යය සඳහා නොයෙකුත් අන්දමින් උදව් කළ මො/තණමල්විල මහා විද්‍යාලයයේ ආචාරිනි ඒ.ඩී.නානායක්කාර මෙණෙවියටත්, ශාස්ත්‍රාචාරිනී රංජනී පරණවිතාන මෙණෙවියටත්, නිබන්ධනය යතුරුලියනය කර දීමේ කාර්යය මැනවින් ඉටු කළ පේරාදෙණිය විශ්වවිද්‍යාලයයේ සිංහල දෙපාර්තමේන්තුවේ සීතා අබේකෝන් මහත්මියටත් මගේ ස්තුතිය පුද කරමි.

14 OCT 1985
පුස්තකාලය